**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල**


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 02/04/2024 පැය

# මාධ්‍ය නිවේදනය

**කේරළ ගංජා සමඟ කිලෝ 48 ග්‍රෑම් 452 ක් සමඟ සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය.**

2024.04.01 වන දින පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ පුත්තලම ඒකකයේ නිලධාරීන් විසින් පුත්තලම බංගදෙනිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර පුත්තලම සිට කොළඹ දෙසට ධාවනය වෙමින් තිබූ වෑන් රථයක් නවතා පරික්ෂා කර අලෙවි කිරීම සඳහා රැගෙන යමින් තිබූ කේරළ ගංජා පාර්සල් 12 ක් සමඟ සුරාබදු නිලධාරීන් සිව්දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

එම සැකකරුවන්ගෙන් අනාවරණය වූ තොරතුරු මත ඔවුන් විසින් කේරළ ගංජා පාර්සල් 10 ක් ලබා දී තිබූ සැකකරුවන් දෙදෙනෙකු එම කේරළ ගංජා පාර්සල් 10 සමඟ හා එම ජාවාරමට ආධාර අනුබල දුන් තවත් සැකකරුවන් දෙදෙනෙකු මීගමුව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇති අතර අත්අඩංගුවට ගන්නා ලද කේරළ ගංජා වල මුළු බර ප්‍රමාණය කිලෝ 48 ග්‍රෑම් 452 ක් වේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30,32,33,41,45,55 හා 64 වයස් වල පසුවන හැටන්, පදවිය, ඌරගස්මංහන්දිය, මාතර, හා මීගමුව ප්‍රදේශ වල පදිංචිකරුවන් වන අතර එම සැකකරුවන් අතර සුරාබදු පරික්ෂකවරයෙකු, සුරාබදු නියාමකවරයෙකු, සුරාබදු සැරයවන්වරයෙකු හා සුරාබදු නියාමන රියදුරෙකු වේ.

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**